සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	කාලය நேரம் Time: පැය 03යි

කෘෂි හා ආහාර තාක්ෂණය I -II

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නම-:..... **විභාග අංකය-:.....**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.**

---

1 පත්‍රය

1. අතීතයේ පැවති දියුණු වාරි තාක්ෂණයක් වන ඇළහැර ඇල මගින් ජලය ලබාදුන් වැව් වනුයේ,
   1. කලා වැව හා තිසා වැව
   2. කන්තලේ වැව හා මින්නේරිය වැව
   3. බසවක්කුලම වැව හා තිසා වැව
   4. පරාක්‍රම සමුද්‍රය හා තෝපා වැව

2. මහ කන්නයේ පමණක් වගා කිරීමෙන්, පුෂ්පීකරණය සිදුවන බෝග ඇතුළත් පිළිතුර වනුයේ,
   1. සලාද, රාබු, කැරට්
   2. මිරිස්, කව්පි, බෝංචි
   3. කෝපි, උක්, ස්ට්‍රෝබෙරි
   4. බීට්, අර්තාපල්, මෑ

3. කෘෂිකාර්මික බෝග වගාවක් සිදුකරන ප්‍රදේශයක වාර්ෂික වර්ෂාපතනය 1750mm ට අඩුවන අතර එහි උච්චත්වය 300m ට වඩා අඩු වේ. මෙම ප්‍රදේශය අයත් කෘෂි දේශගුණික කලාපයේ සංකේතය විය හැක්කේ,
   1. IU 2. WU 3. WL 4. DL

4. පසක කැටායන හුවමාරු ධාරිතාව රඳාපවතින්නේ එම පසේ ඇති කුමන බනිජ අංශු මතද?
   1. වැලි හා බොරළු
   2. වැලි හා රොන්මඩ
   3. හියුමස් හා මැටි
   4. මැටි හා රොන්මඩ

5. අධික ලෙස සෝදා පාළුවට ලක්වූ පසක පාංශු පැතිකඩේ දක්නට නොලැබෙන පාංශු ස්ථරය වනුයේ,
   1. A 2. B 3. C 4. R

6. ක්ෂේත්‍ර ධාරිතාවේ ඇති පසක් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A - ක්ෂුද්‍ර හා මහා අවකාශ සියල්ලම ජලයෙන් පිරී පවතී.
   B - කේශාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය උපරිම ධාරිතාවෙන් පවතියි.
   C - මහා අවකාශවල පවතින ජලය ගුරුත්වාකර්ෂණ බලය යටතේ පහලට ගලා යන නිසා මහා අවකාශ තුළ වාතය පිරී පවතී.
   මින් සත්‍ය වනුයේ,
   1. A පමණි. 2. A හා B පමණි. 3. B හා C පමණි. 4. A, B හා C සියල්ලම නිවැරදිය.

7. ගංගා මිටියාවත්වල ව්‍යාප්තව ඇති, පාංශු පැතිකඩේ ස්ථර දක්නට නොලැබෙන, pH අගය 5.5 - 7 පමණ වන සාරවත් බවින් ඉහළ පස් වර්ගය හඳුන්වන නම වනුයේ,
   1. දියලු පස
   2. රතු දුඹුරු පස
   3. රතු කහ පොඩ්සොලික් පස
   4. රතු කහ ලැටසෝල්ස් පස


Past Papers Wiki

8. පහත දැක්වෙන බෝග හා කුලය නිවැරදිව ගලපා ඇති පිළිතුර වනුයේ,

කුලය	බෝගය
1. රුටේසියේ	ගෝවා, සලාද
2. ෆැබේසියේ	අර්තාපල්, තක්කාලි
3. කුකුර්බිටේසියේ	උඳු, මුං
4. පොඒසියේ	මෙනේරි, තණහාල්

9. බිම් සැකසීමේ ක්‍රියාවලියේ දී ප්‍රාථමික බිම් සැකසීමේ පියවර තුළ සිදුවන ක්‍රියා දාමයක් වන්නේ,
1. පෙරළන ලද පස් කැට පොඩි කිරීම.
2. පස මට්ටම් කර පාත්ති සැකසීම.
3. පස මතුපිට ඇති වල් පැළැටි හා කාබනික ද්‍රව්‍ය පසට යට කිරීම.
4. ඇළි හා වැටි දැමීම.

10. පහත උපකරණය, බිම් සැකසීමේ උපකරණ වර්ගීකරණයට අනුව




1. යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
2. මිනිස් බලයෙන් ක්‍රියාකරවන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
3. සත්ත්ව බලයෙන් ක්‍රියාකරවන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.
4. යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.

11. පහත බෝග අතුරින් තවාන් පාත්ති දැමීමට වඩාත් යෝග්‍ය බෝග කාණ්ඩය කුමක් ද?
1. කව්පි, බණ්ඩක්කා, කරවිල
2. රාබු, වම්බටු, මිරිස්
3. තක්කාලි, මුං, වම්බටු
4. මිරිස්, වම්බටු, තක්කාලි

12. එළවළු බීජ තවාන් වල ප්‍රරෝහණය වන බීජ වලට හා තවාන් පැළ වලට වැළඳෙන රෝගයක් වන්නේ,
1. හිටුමැරීම
2. දියමලන් කෑම
3. ඇන්ත්‍රැක්නෝස්
4. මුල ගැට රෝගය

13. ජල සම්පාදන ක්‍රම අතුරින් පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් හා උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් පිළිවෙළින් සඳහන් කල පිළිතුර තෝරන්න.
1. බෙසම් ජල සම්පාදනය, තීරු ජල සම්පාදනය
2. සවිවර නළ යෙදීම, ඉසින ජල සම්පාදනය
3. ඇලි හා වැටි ජල සම්පාදනය, මැටි කළ වැළලීම
4. බිංදු ජල සම්පාදනය, සවිවර නළ යෙදීම

14. මෙම රූප සටහනෙන් පෙන්නුම් කරන ජලවහන කානු රටාව වන්නේ,



1. සමාන්තර කානු රටාව
2. හෙරින්බෝන් කානු රටාව
3. අහඹු කානු රටාව
4. ශ්‍රිඩ් අයන් කානු රටාව

15. ඩැපොග් තවානෙන් ලබා ගන්නා වී බීජ පැළ ක්ෂේත්‍රයේ සිටුවිය යුතු කාල සීමාව වනුයේ,
1. දින 5 - 8
2. දින 10 - 12
3. දින 15 - 20
4. දින 20 - 25

16. වී වගාවේ අස්වනු නෙළීම සඳහා සුදුසු කාලය වනුයේ,
1. සියළුම කරල් රන්වන් පැහැයට පත් වූ පසුවය.
2. මේරූ කරල් වලින් 85%ක් රන්වන් පැහැයට පත් වූ පසුවය.
3. මේරූ කරල් වලින් 75%ක් රන්වන් පැහැයට පත් වූ පසුවය.
4. මේරූ කරල් වලින් අඩකට වඩා රන්වන් පැහැයට පත් වූ පසුවය.

17. කෝටු රාමු ක්‍රමයට කොම්පෝස්ට් සැකසීමේ දී කෝටු ලෙස යොදා ගැනීමට වඩාත් යෝග්‍ය ජීවී ශාක කාණ්ඩය වනුයේ,
1. එරබදු, කැකුණ
2. ග්ලිරිසිඩියා, එරබදු
3. ග්ලිරිසිඩියා, ඉපිල් ඉපිල්
4. අඹ, ඉපිල් ඉපිල්

18. ශාක වලට පොහොර යෙදීම පිළිබඳව නිවැරදි ප්‍රකාශ වනුයේ,
A) බෝගයක් වර්ධනය වන අවස්ථාවේ නයිට්‍රජන් පෝෂකය වැඩිපුර අවශ්‍ය වන අතර මල් පිපෙන අවධියේ පොස්පරස් පෝෂකය වැඩිපුර අවශ්‍ය වේ.
B) වී වගාවේදී යොදා ගන්නා බන්ඩි පොහොර මිශ්‍රණයේ නයිට්‍රජන් හා පොටෑසියම් පමණක් අඩංගු වේ.
C) බෝග වලට මූලික පොහොර යෙදීමේදී ඒවා බෝග සිටුවීමට පෙර පසට එකතු කරයි.
1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. A, B හා C පමණි.

19. පූර්ණ රූපාන්තරණයක් දක්වන පළිබෝධ කාණ්ඩය වනුයේ,
1. අවුලකපෝරා කුරුමිණියා, රතු පොල් කුරුමිණියා, පළතුරු මැස්සා
2. ඉල් මැස්සා, අවුලකපෝරා කුරුමිණියා, කූඩිත්තන්
3. පස්මුලු මකුණන්, කූඩිත්තන්, ඉල් මැස්සන්
4. ගොයම් මකුණා, අවුලකපෝරා කුරුමිණියා, පළතුරු මැස්සා

20. සොලනේසියේ හා කුකර්බිටේසියේ කුලයේ බෝග වලට බහුලව වැළඳෙන බැක්ටීරියා රෝගයකි.
1. ඇන්ත්‍රැක්නෝස් 2. දියමලන් කෑම 3. හිටු මැරීම 4. වද පිදීම

21. වල් නාශක භාවිතය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
1. භූගත කොටස් සහිත වල් පැළෑටි පාලනය සඳහා සංස්ථානික වල්නාශක යොදා ගනී.
2. තෝරා නසන වල් නාශක මගින් පළල් පත්‍ර හා පන් වර්ග මර්ධනය වේ.
3. වී වගාවේ වල් පැළ පාලනය සඳහා තෝරා නසන වල් නාශක යොදා ගනී.
4. ඇටවරා, කලාදුරු, ගහල වැනි වල් පැළෑටි සඳහා ස්පර්ශ වල් නාශක යොදා ගනී.

22. සංරක්ෂණ ගොවිතැනට අයත් උප පද්ධති අතරින් ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි උප පද්ධතිය වනුයේ,
1. ජෛව ආස්තරණ පද්ධතිය 2. මිශ්‍ර බෝග පද්ධතිය
3. කෘෂි වන වගාව 4. බෝග ඉපනැලි සහ සජීවී ආවරණ බෝග වසුන්

23. ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි මන්ද පෝෂණයට බලපාන ප්‍රධාන හේතු සාධකය වනුයේ,
1. යකඩ ඌණතාවය 2. විටමින් ඌණතාවය
3. ප්‍රෝටීන් ශක්ති මන්ද පෝෂණය 4. අයඩින් ඌණතාවය

24. ආහාර විෂවීම පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
A. හාල්මැස්සන් හා තක්කාලි නිතර ආහාරයට ගැනීම නිසා මුත්‍රා ගල් සෑදේ.
B. ආහාර දැවටීම සඳහා මුද්‍රිත කඩදාසි යොදා ගැනීම ඊයම් ආහාරය සමග මිශ්‍ර වීම සිදු වේ.
C. ආම්ලික ආහාර ලෝහ බඳුන්වල පිසීම මගින් ආහාර විෂවීම වළක්වාගත හැක.
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. A,B හා C සියල්ලම.

25. ආහාර ද්‍රව්‍ය ප්‍රමිතිකරණයට ලක් කිරීම මගින් පාරිභෝගිකයන්ට ලැබෙන වාසියක් වන්නේ,
1. ආහාර පිළිබඳ ඇති පාරිභෝගික විශ්වාසනීයත්වය වැඩි දියුණු වීම.
2. නිෂ්පාදන ආයතනවල ඵලදායීතාව වැඩිවීම.
3. නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වී නිෂ්පාදන ලාභය වැඩි වීම.
4. ආනයනය කරන භාණ්ඩ ප්‍රමාණය ඉහළ යාම.

26. වායව අතු බැඳීම සඳහා වඩාත් යෝග්‍ය ශාක වන්නේ,
1. ලෙමන්, සමන්පිච්ච 2. ගම්මිරිස්, බුලත් 3. මිදි, සමන්පිච්ච 4. ජම්බු, දෙලුම්

27. බටු, මිරිස්, තක්කාලි බීජ ප්‍රරෝහණයේදී
1. බීජාධරය හා බීජෝපරිය පොළොව මට්ටමට වඩා පහළින් පිහිටයි.
2. බීජෝපරිය, බීජාධරයට වඩා වේගයෙන් වර්ධනය වේ.
3. බීජාධරය, බීජෝපරියට වඩා වේගයෙන් වර්ධනය වේ.
4. ප්‍රථමයෙන් වර්ධනය වන බීජාංකුරය බීජයෙන් පිටතට පැමිණෙයි.

28. ශාකයේ පාදස්ථයට ආසන්නව කදෙන් හටගන්නා භූගත ශාඛාවල ආහාර තැන්පත් වීමෙන් සෑදෙන ස්වාභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහය වන්නේ,
1. රෙසෝමය 2. බල්බය 3. ස්කන්ධ ආකන්ධය 4. කෝමය

29. ශාක බද්ධ කිරීමේදී යොදාගන්නා අනුජ ග්‍රාහක සම්බන්ධතාවයට වඩාත් ගැලපෙන නිදසුන වනුයේ,

	බෝගය	ග්‍රාහකය ලෙස සුදුසු ශාක වර්ගය/ප්‍රභේද	අනුජ ලෙස සුදුසු ශාකවර්ග/ ප්‍රභේද
1.	රඹුටන්	මල්වාන වරණය	දේශීය රඹුටන්
2.	දොඩම්	දිවුල්	පැණි දොඩම්
3.	මැංගුස්ටින්	මැංගුස්ටින්	රට ගොරක
4.	අඹ	කරතකොලොම්බන්	රට අඹ

30. පොල්, තල් වැනි බීජ මව් ශාකයෙන් වෙන් වූ වහාම ප්‍රරෝහණය නොවීමට හේතුව වනුයේ,
1. ඝන බීජාවරණයක් තිබීමය. 2. බීජයේ කලලය අක්‍රියව පැවතීමය.
3. බීජයේ කලලය පරිණත නොවී පැවතීමය. 4. බීජාවරණය ජලය හා වාතයට අපාරගම්‍ය වීමය.

31. බෝග අවට උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය ආලෝකය හා වාතයේ සංයුතිය ඇතුළු සියලුම පාරිසරික තත්ත්ව බෝගයේ අවශ්‍යතාවයට පවත්වා ගන්නා ආරක්ෂිත වගා ව්‍යුහය වන්නේ.
1. ලී පටි නිවාස 2. දැල් ගෘහ 3. සෙවන ගෘහ 4. හරිතාගාර

32. නිර්පාංශු වගා ක්‍රම යටතේ සිරස් වගා මලු වල වගා කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. ඇතුලත හා පිටත සුදු පැහැති පාරජම්බුල කිරණ ප්‍රතිරෝධී පොලිතීන් භාවිතා කරයි.
B. වගා මලු ජීවානුහරිත කොහුබත් වලින් පුරවනු ලැබේ.
C. නළ පද්ධතියක් මගින් පෝෂක ද්‍රාවණය සපයනු ලැබේ.
D. පෝෂක ද්‍රාවණය චක්‍රීකරණය වන ලෙස යොදා ගනු ලැබේ.
මින් සත්‍ය ප්‍රකාශ වනුයේ,
1. A, B හා C 2. A, C හා D 3. A, B හා D 4. B,C හා D

33. අධිශීතනය මගින් ආහාර කල්තබා ගැනීම පිළිබඳ සත්‍ය ප්‍රකාශනය වනුයේ,
1. ආහාරය 0 ^{o}C උෂ්ණත්වයේ ගබඩා කරයි.
2. කෙටි කාලයක් ආහාර පරිරක්ෂණය කළ හැක.
3. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම නතර වේ.
4. ජලය මිදෙන උෂ්ණත්වයේ ආහාර ගබඩා කිරීමෙන් ආහාරය දීර්ඝ කාලයක් පරිරක්ෂණය කළ හැක.

34. පරිණත අවධියට පසුව අස්වනු නෙළීම නිසා ඒවායේ තන්තුමය ස්වභාවය වැඩි වී ගුණාත්මයට හානි සිදුවන අස්වනු කාණ්ඩ වනුයේ,
1. මිරිස්, මෑ 2. වම්බටු, බණ්ඩක්කා
3. තක්කාලි, කරවිල 4. බණ්ඩක්කා, වැටකොළු

35. පිරිසිදු යුරෝපීය ගව වර්ග ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වඩාත්ම සුදුසු ගව පාලන කලාපය වනුයේ,
1. උඩරට කලාපය 2. පහතරට තෙත් කලාපය
3. පහතරට වියළි කලාපය 4. මැදරට කලාපය

36. ගව පැටවුන් පාලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. මුල් දින තුන තුළ පැටවුන්ට ප්‍රමාණවත් පරිදි මුල් කිරි ලබාදිය යුතුය.
B. හතරවන දින වන විට සාමාන්‍ය කිරි ලබාදෙන අතර එම කිරි ප්‍රමාණය පැටවාගේ උපත් බරින් 25% විය යුතුය.
C. පැටවාගේ බර උපත් බර මෙන් දෙගුණයක් වූ විට කිරි වැරීම කළ යුතුය.
මින් නිවැරදි වනුයේ,
1. A හා B පමණි 2. B හා C පමණි 3. A හා C පමණි 4. A, B හා C පමණි

37. ගව දෙනෙක පැටවකු බිහි කිරීමෙන් පසු පූර්ව පාද දරදඬු වීම, හිසේ වෙව්ලන ස්වභාවයක් ඇති වීම හා බෙල්ල පිටුපසට හරවා වැතිරී සිටීම යන රෝග ලක්ෂන පෙන්වුණි නම් එම රෝගය විය හැක්කේ,
1. කුර හා මුඛ රෝග 2. කාල ගාත්‍රා රෝගය
3. ගව රක්තාශ්‍රය රෝගය 4. කිරි උණ

38. බිත්තර දමන සතුන්ගේ පැටව් අවධියේ සිට වර්ධක අවධියට මාරුවන විට සපයන ආලෝක පැය ගණන විය හැක්කේ,
1. පැය 8 - 10 කි. 2. පැය 10 - 12 කි 3. පැය 12 – 14 කි. 4. පැය 14 -16 කි.

39. මස් සඳහා කුකුළන් ඇති කිරීමේ දී,
1. දින 1-28 දක්වා ලබාදෙන ආරම්භක සලාකයේ ප්‍රෝටීන් ප්‍රතිශතය 18%-20% පමණ විය යුතුය.
2. වර්ධක අවධියේදී ආහාර සලාක ලබාදෙන විට සීමාව ඇතිව ලබා දිය යුතුය.
3. දිනක් වයසැති බ්‍රොයිලර් පැටවුන් නිකුත් කිරීමේදී ලිංග තේරීමක් සිදු නොකරයි.
4. කුඩුවලට රාත්‍රී කාලයේදී ආලෝකය සැපයීම සිදු නොකරයි.

40. ටෙට්‍රා පැක් ඇසුරුමක අභ්‍යන්තරයේ සිට බාහිරය දක්වා භාවිතා කර ඇති විවිධ ඇසුරුම් ද්‍රව්‍ය වල පිළිවෙල නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,
1. අභ්‍යන්තර පොලිතීන් පටලය - ප්ලාස්ටික් ස්ථරය - ඇලුමිනියම් ස්ථරය - බාහිර පොලිතීන් පටලය
2. අභ්‍යන්තර පොලිතීන් පටලය - ඇලුමිනියම් පටලය - කඩදාසි ස්ථරය - බාහිර පොලිතීන් පටලය
3. ඇලුමිනියම් පටලය - අභ්‍යන්තර පොලිතීන් පටලය - කඩදාසි ස්ථරය - බාහිර පොලිතීන් පටලය
4. අභ්‍යන්තර පොලිතීන් පටලය - කඩදාසි ස්තරය - ඇලුමිනියම් පටලය - බාහිර පොලිතීන් පටලය

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	කෘෂි හා ආහාර තාක්ෂණය I -II	
11 ශ්‍රේණිය		

පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) සිසුන් විසින් පාසල තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් ලෙස පාසල් ගෙවත්තක් ආරම්භ කර පවත්වාගෙන යන ලදී.
   I. ගෙවත්තේ වගා කිරීමට සුදුසු සොලනේසියේ හා ෆැබේසියේ කුලවල බෝග වර්ග දෙක බැගින් සඳහන් කරන්න.
   II. වර්ෂයේ ඕනෑම කාලයක දී අස්වනු ලබාදෙන පළතුරු බෝග වර්ග දෙකක් නම් කරන්න.
   III. ගෙවතු වගාවේදී භාවිත කළ හැකි කොළ පොහොර වර්ග දෙකක් නම් කරන්න.
   IV. පාසල්භූමිය තුල පැළ ලබාගැනීමට තවාන් නඩත්තු කරන්නේ නම් එහිදී භාවිත කළ හැකි පරිසර හිතකාමී බදුන් වර්ග දෙකක් සඳහන් කරන්න.
   V. ගෙවත්තේ පෝෂක අවශ්‍යතාවය සැපයීම සඳහා රසායනික පොහොර යෙදීමට අදහස් කළේ නම් නයිට්‍රජන් හා පොටෑසියම් පෝෂක ලබාදීමට යෙදිය යුතු රසායනික පොහොරක් බැගින් නම් කරන්න.
   VI. ගෙවත්තට ජල සම්පාදනය සඳහා විසිරුම් ජල සම්පාදන ක්‍රමයක් සැලසුම් කළේ නම් එම පද්ධතියක අඩංගු විය යුතු කොටස් නම් කරන්න.
   VII. ගෙවත්තේ ඇති වම්බටු වගාවක ඇතැම් පත්‍ර දැලක් මෙන් දිස්වන සේ නාරටි අතර කොටස් කා දමා ඇති බව දක්නට ලැබිණි.
      a) එම හානිය සිදුකරන පළිබෝධකයා නම් කරන්න.
      b) එම හානිය සිදුකරන්නේ පළිබෝධකයාගේ ජීවන චක්‍රයේ කුමන අවධියක දී ද?
   VIII. ගෙවත්තේ දී භාවිත කළ හැකි පරිසර හිතකාමී පළිබෝධ නාශක දෙකක් සඳහන් කරන්න.
   IX. ගෙවත්තේ ඇති පලතුරු වගාවේ අතිරික්ත අස්වනු කල්තබා ගැනීමට භාවිත කළ හැකි පරිරක්ෂණ ක්‍රමයක් හා එයට උදාහරණයක් දෙන්න.
   X. පලතුරු බෝග වල අස්වනු නෙළීමේ දී සිදුවන පසු අස්වනු හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

2) බෝග වර්ධනයේ සිට අස්වැන්න ලබා ගන්නා තෙක් දේශගුණික සාධක පිළිබඳ සැළකිලිමත් වීම ඉතා වැදගත් වේ.
   I. ශාක තුළ සිදුවන ජෛව ක්‍රියාවලියන් කිහිපයක් පහත දැක්වේ. ඒ සඳහා වැදගත් වන දේශගුණික පරාමිතියක් බැගින් සඳහන් කරන්න.
      a) දඬු කැබලිවල මුල් ඇද්දවීම.
      b) පුෂ්පීකරණය.
      c) ප්‍රභාසංස්ලේෂණය.
      d) ශ්වසනය.
      e) උත්ස්වේදනය.
      f) බීජ ප්‍රරෝහණය.
   II. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න වන යල හා මහ සඳහා වර්ෂාව ලැබෙන වර්ෂාපතන ආකාර හා ඊට අදාල කාලවකවානු සඳහන් කරන්න.
   III. a) බෝග වගාව කෙරෙහි සුළඟේ හිතකර හා අහිතකර බලපෑම් දෙක බැගින් සඳහන් කරන්න.
      b) ආලෝක තීව්‍රතාවට ශාක දක්වන ප්‍රතිචාර අනුව ශාක බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ වර්ගකර උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

PAST PAPERS WIKI

3) බෝග වගාවේ උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා පාංශු සංසටක හැසිරවීම ඉතා වැදගත් වේ.

I. පසක කාබනික ද්‍රව්‍යවල වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

II. a) පසේ ජලය පවතින ආකාර සඳහන් කරන්න.

b) ඉන් ශාක වර්ධනය සඳහා වැදගත් වන ජල ආකාරය නම් කරන්න.

III. a) පසක් ආම්ලික හා භාෂ්මික වීමට බලපාන හේතු දෙක බැගින් සඳහන් කරන්න.

b) ආම්ලික හා භාෂ්මික පසක් යථා තත්ත්වයට ගෙන ඒමට පසට එකතු කළ යුතු ද්‍රව්‍යයක් බැගින් සඳහන් කරන්න.

4) මනා බෝග සංස්ථාපනයක් සඳහා ක්‍රමවත් ලෙස බිම් සැකසීම අවශ්‍ය වේ.

I. බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක සඳහන් කරන්න.

II. a) බෝග සංස්ථාපනයට ගුණාත්මක පැළ ලබා ගැනීමට තවාන් නඩත්තු කළ යුතු වේ. තවානක් සෑදීමට සුදුසු ස්ථානයක් තේරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

b) බෝග වගාවේදී භාවිතා කරන තවාන් වර්ග දෙකක් නම් කරන්න.

III. a) ජල සම්පාදන ක්‍රම වලදී යොදා ගන්නා ස්වාභාවික ජල ප්‍රභව දෙකක් නම් කරන්න.

b) බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම් හතරක් සඳහන් කරන්න.

5) ශාක වර්ධක ප්‍රචාරණයේ දී බහුලවම දඬු කැබලි යොදාගනියි.

I. a) මේරීමේ අවධිය අනුව දඬු කැබලි වර්ග කරන්න.

b) එම එක් එක් අවධිය සඳහා සිටුවීමට සුදුසු බෝග වලට උදාහරණ දෙක බැගින් ලියන්න.

II. a) සිටුවීම සඳහා දඬු කැබැල්ලක් පිළියෙල කර ගන්නා අයුරු කෙටියෙන් සඳහන් කරන්න.

b) සිටුවීමෙන් පසු වඩාත් සාර්ථකව මුල් ඇදීම සඳහා ලබාදිය යුතු පරිසර තත්ත්ව සඳහන් කරන්න.

III. දඬු කැබලි හැර සිටුවීමට යොදා ගන්නා වෙනත් ශාක වර්ධක කොටස් දෙකක් නම් කරන්න.

6) බෝග වගාවේ ඵලදායිතාව අඩුවීමට එක් ප්‍රබල සාධකයක් ලෙස පළිබෝධ හානි හැඳින්විය හැක.

I. a) වල් පැළෑටිවල පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

b) වගා බිමේ තිබෙන වල් පැළෑටි බෝගයට හානි සිදුකල හැකි මට්ටමට අඩුවෙන් පවත්වා ගැනීමට අනුගමනය කළ හැකි ශාස්ත්‍රීය විද්‍යාත්මක ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

II. a) ශාකයකට රෝගයක් වැලදීමට සම්පූර්ණ විය යුතු සාධක තුනකි. රෝග ත්‍රිකෝණය මඟින් එය පෙන්නුම් කරන්න.

b) වෛරස් රෝගවල පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

III. වී වගාවේදී අනුගමනය කරන සම්ප්‍රදායික පළිබෝධ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

7) සත්ත්ව පාලනයේ ඉහල නිෂ්පාදනයක් ලබා ගැනීමට නම් ගව පාලනයේදී ගොවිපල සතුන් පැටවුන් අවස්ථාවේ සිටම මනා පාලනයකින් යුතුව රැකබලා ගැනීම අවශ්‍ය වේ.

I. a) සියුම් ක්‍රමයට සතුන් ඇති කිරීමේ වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න.

b) සියුම් ක්‍රමයට සතුන් ඇති කිරීමේදී යොදා ගැනෙන නිවාස ආකාර දෙක සඳහන් කරන්න.

II. a) වසරකට එක් පැටවකු ලබා ගැනීම තුලින් ගව පාලනයේ ඉහල නිෂ්පාදනයක් ලබා ගැනීමට නම් ගව දෙනකුගේ මද ලක්ෂණ ගැන සැලකිලිමත් විය යුතුය. එවැනි මද ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

b) සතුන් ගැබ් ගැනීමේ ක්‍රම දෙක සඳහන් කරන්න.

c) එම එක් එක් ක්‍රමයේ වාසිය බැගින් සඳහන් කරන්න.

III. ගව පැටවකු ඉපදුන විගස කළ යුතු කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank